ජාතික යෞවන නාට්‍ය තරගාවලිය - 2023

ජාතික තරුණ සේවා සභාව මගින් වාර්ෂිකව සංවිධානය කොට පවත්වනු ලබන ජාතික යෞවන නාට්‍ය තරගාවලිය මෙවරද 42 වන වරට පැවැත්වීමට කටයුතු යොදා ඇත. ජාතික යෞවන නාට්‍ය තරගාවලියේ නාට්‍ය නිර්මාණ 2වන වටය ලෙස පලාත් මට්ටමින් විනිසුරු මණ්ඩලය නාට්‍ය නරඹා ඇගයීමට ලක්කොට අවසන් වටය සඳහා සුදුසු නාට්‍ය/කෙටි නාට්‍ය තෝරා ගැනීම සිදුවේ.

යෞවන නාට්‍ය තරගාවලිය - 2023 සිංහල හා දමිළ මාධ්‍යයෙන් පැවැත්වේ.

ජාතික යෞවන නාට්‍ය තරගාවලියට අදාළ පොදු උපදෙස්

- යෞවන නාට්‍ය උළෙලේ ගුණාත්මක භාවය රදවා ගනිමින් ආධුනික නිර්මාණකරුවන් ජාතික තලය දක්වා රැගෙන එමින් අංකුර නිර්මාණකරුවන් දිරිගැන්වීම සඳහා විනිසුරු මණ්ඩලය පළාත් වශයෙන් ගොස් නාට්‍ය නිෂ්පාදන නරඹා අවසන් වටයට වඩාත් උසස් නාට්‍ය තෝරා ගැනීමට තීරණය කර ඇත.

- 2023 යෞවන නාට්‍ය තරගාවලිය සඳහා ඉදිරිපත්විය හැකි වයස අවුරුදු 15 – 35 ත් අතර වේ.(සියළුම ශිල්පීන්)නාට්‍ය පිටපත් භාර ගන්නා අවසන් දිනය වන 2023/03/24 වන දිනට අවුරුදු 15 – 35 ත් අතර වීම. ( 1988.03.24 දිනට පසු හා 2008.03.24 දිනට පෙර උපන් අය විය යුතුය.

- අයදුම්පත් කැදවීමේ අවසන් දිනය 2023/03/24

- ජාතික යෞවන නාට්‍ය තරගාවලිය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් දිගු නාට්‍ය හා කෙටි නාට්‍ය තරගාවලියක් වශයෙන් පැවැත්වේ.

- දිගු නාට්‍ය හා කෙටි නාට්‍ය අංශය සඳහා ඉදිරිපත් කරන නිර්මාණ පැහැදිලි අත් අකුරින් හෝ පරිගණක අකුරු වලින් සකස් කර එක් නිර්මාණයකින් පිටපත් 01 බැගින් ඉදිරිපත් කළ යුතුය. දිගු නාට්‍ය පැය 1 ත් පැය 2 ½ ත් අතර ද කෙටි නාට්‍ය විනාඩි 15 ත් - 30 ත් අතර ද විය යුතුය. (විස්තර අයදුම් පත්‍රයේ සඳහන් කළ යුතු අතර නාට්‍ය පිටපතෙහි රචකයාගේ විස්තර සඳහන් නොකල යුතුය.)

- ජාතික තරුණ සේවා සභාව විසින් පනවන කොන්දේසිවලට අනුව නාට්‍ය නිර්මාණය ඉදිරිපත් කළ යුතුය. නාට්‍ය නිර්මාණය තුළ මත්ද්‍රව්‍ය මත්පැන් භාවිතය සජීවීව ප්‍රදර්ශනය කෙරෙන හෝ විවිධ ජාතික සංස්කෘතික අනන්‍යතා අභියෝගයට ලක් කෙරෙන දර්ශන ඇතුලත් කිරිම නොකළ යුතුය.

- ජාතික තරගයට සුදුසුකම් ලබන කෙටි නාට්‍ය හා දිගු නාට්‍ය සඳහා ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලයේ සහතිකය ඉදිරිපත් කළ යුතුය.

- අදාළ පළාත තුල ප්‍රදර්ශනය වන නාට්‍ය වල අයදුම්කරු(නාට්‍ය නිෂ්පාදක) අදාල පළාත තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

- සියලුම අයදුම්කරුවන් ජාතික තරුණ සේවා සභාවේ නාට්‍ය තරගාවලිය සඳහා නිකුත් කරනු ලබන චක්‍රලේඛයට යටත්ව නිකුත් කර ඇති අයදුම්පත්‍රය මගින් පමණක් අයදුම් කල යුතු අතර වෙනත් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- නාට්‍ය සඳහා අයදුම් කරන සියලු අයදුම්කරුවන් තම අයදුම්පත සමග නාට්‍ය/කෙටි නාට්‍ය පිටපත ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන කාර්යාලයේ සංස්කෘතික අංශය වෙත නියමිත දිනට පෙර ගෙනවිත් භාරදීම හෝ සහකාර අධ්‍යක්ෂ (සංස්කෘතික), ජාතික තරුණ සේවා සභාව, අංක 65, හයිලෙවල් පාර, මහරගම. ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කල යුතුය.

- පළාත් වශයෙන් නාට්‍ය වේදිකාගතවන අවස්ථාවේදී නාට්‍යයට සම්බන්ධ සියලුම ශිල්පීන්ගේ අනන්‍යතාව පරීක්ෂා කරන බැවින් අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ඊට අදාළ ජාතික හැඳුනුම්පත, තැපැල් හැඳුනුම්පත, ගුවන් ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය ඉදිරිපත් කල හැකි අතර එසේ නොමැති විට උප්පැන්න සහතිකයෙහි මුල් පිටපත සමග අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී, විහාරාධිපති හෝ රජයේ පිළිගත් විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සහතික කරන ලද පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

- ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අඩුපාඩු සහිත අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- සම්මාන උළෙලෙන් පසුව වුවද කිසියම් වංචනික ක්‍රියාවක් කළ බවට ඔප්පු වුවහොත් සම්මාන සහතිකය සහ ත්‍යාග මුදල අවලංගු කිරීම , ඉදිරි යෞවන නාට්‍ය තරග සහභාගීත්වය වසර 05 ක කාලයකට අවලංගු කිරීම ආදී වශයෙන් ජාතික තරුණ සේවා සභාවේ නීති රෙගුලාසි හා තීරණවලට එකග විය යුතුය.

- විනිශ්චය මණ්ඩලය විසින් ලබා දෙන තීරණය අවසන් තීරණය ලෙස තරගකරුවන් පිළිගත යුතුය.

- තරගාවලිය සම්බන්ධ තොරතුරු සහ චක්‍රලේඛ උපදෙස් www.nysc.lk වෙබ් අඩවිය මගින් ලබා ගත හැකිය.

ජාතික යෞවන නාට්‍ය තරගාවලියට අදාළ තරග අංශ

I. කෙටි නාට්‍ය සිංහල මාධ්‍ය
II. කෙටි නාට්‍ය දෙමළ මාධ්‍ය
III. දිගු නාට්‍ය සිංහල මාධ්‍ය
IV. දිගු නාට්‍ය දෙමළ මාධ්‍ය

යොවුන් නාට්‍ය තරගාවලියේදී ඇගයීම් කරනු ලබන තරග අංශ හා අනුෂාංගික අංශ

කෙටි නාට්‍ය - සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය , දිගු නාට්‍ය - සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය

- හොඳම රචනය ප්‍රථම
- හොඳම රචනය දෙවන
- හොඳම රචනය තෙවන
- හොඳම නිෂ්පාදනය ප්‍රථම
- හොඳම නිෂ්පාදනය දෙවන
- හොඳම නිෂ්පාදනය තෙවන
- හොඳම අධ්‍යක්ෂනය
- හොඳම රංගනය පිරිමි
- හොඳම රංගනය කාන්තා
- හොඳම සහය රංගනය පිරිමි
- හොඳම සහය රංගනය කාන්තා
- හොඳම සංගීතය
- හොඳම ඇඳුම් නිර්මාණය
- හොඳම පසුතල නිර්මාණය
- හොඳම අංග රචනය
- හොඳම වේදිකා පරිපාලනය
- හොඳම ආලෝකකරණය
- හොඳම රංග වින්‍යාසය
- ජූරියේ විශේෂ ඇගයීම (උපරිම සම්මාන සංඛ්‍යාව 06 කි)
- කුසලතා සහතික 15

ඉහත සම්මාන ප්‍රදානයේ දී එක් එක් ඇගයීම් අංශයන් සදහා ඇගයීමට ලක්වන්නේ එක් අයෙක් පමණි. තරග අංශ හා අනුෂාංගික අංශ ඇගයීමේදී කිහිප දෙනෙකු ඉදිරිපත් වී නම් සදහන් වුවද පිරිනමනුයේ එක් සම්මානයක් පමණි.

ලියාපදිංචි අංකය

# ජාතික යෞවන නාට්‍ය තරඟාවලිය - 2023

## ................................................... තරඟය සඳහා අයදුම්පත්‍රය

**(එක් තරඟයක් සඳහා එක් අයදුම්පතක් භාවිතා කළ යුතුය)**

වයස් සීමාව වයස අවුරුදු 15 - 35 (උපන්දිනය 1988/03/24 දිනට පසු හා 2008/03/24 දිනට පෙර)

තරඟ මාධ්‍ය - සිංහල / දමිළ
කෙටි නාට්‍ය / දිගු නාට්‍ය
(අනවශ්‍ය දෑ කපා හරින්න)

01 නාට්‍ය නිෂ්පාදකගේ සම්පූර්ණ නම : ........................................................................................`

02 මුලකුරු සමග නම : ..............................................................................................

03 ස්ථිර ලිපිනය : ..............................................................................................

04 දුරකථන අංකය : ..............................................................................................

05 උපන් දිනය : ..............................................................................................

06 2023.03.24 දිනට වයස : ..............................................................................................

07 ජාතික හැදුනුම්පත් අංකය : ..............................................................................................

08 දිස්ත්‍රික්කය :- .........................

09 පළාත :- .........................

10 නිර්මාණයේ නම : ..............................................................................................

ජාතික තරුණ සේවා සභාව විසින් සංවිධානය කරනු ලබන 2023 ජාතික යෞවන නාට්‍ය තරඟයට මා විසින් ඉදිරිපත් කළ අයදුම්පත්‍රයේ කරුණු සත්‍ය බවත් මෙම තරඟයේ දී ජාතික තරුණ සේවා සභාවේ නීති රෙගුලාසි හා තීරණ වලට එකඟ වන බවත් විනිශ්චය මණ්ඩලය විසින් ලබා දෙන තීරණය අවසන් තීරණය ලෙස පිළිගන්නා බව මෙයින් ප්‍රකාශ කරමි.

දිනය :- ...................................

........................................
නාට්‍ය නිෂ්පාදකගේ අත්සන